# බුදුදහම හා සෞන්දර්ය සංකල්ප

කේ. ඒ. වීරසේන

ලි. ප. අංකය : A 19135

161996

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බෞද්ධ ශිෂ්ටාචාරය
පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය.

2001

# සාරාංශය


මෙම කෘතියෙහි හැඳින්වීම පිළිබඳ කොටස, මෙහි අරමුණු, සෞන්දර්ය සංකල්ප සහ බුදුසමය අතර ඇති සම්බන්ධය, විෂය ක්ෂේත්‍රය, විෂය සීමාව, පර්යේෂණ විධික්‍රමය, ඓතිහාසික විශ්ලේෂණය හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය පිළිබඳ සාකච්ඡා කරයි.

පළමු වැනි පරිච්ඡේදය සෞන්දර්ය පිළිබඳ නිර්වචන යනුවෙන් නම් කර ඇත. සෞන්දර්ය සම්බන්ධයෙන් බෞද්ධ ග්‍රන්ථවලත්, භාරතීය හා බටහිර කාව්‍යය විචාර ග්‍රන්ථවලත් දැක්වෙන නිර්වචන පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් මෙහි දී ඉදිරිපත් කර ඇත.

දෙවෙනි පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ පාලි බෞද්ධ ග්‍රන්ථවල සෞන්දර්ය සම්බන්ධයෙන් දැක්වෙන සංකල්ප පිළිබඳ හැඳින්වීමක් හා විග්‍රහයක් කිරීමටයි. දීඝ ආදි පාලි නිකාය ග්‍රන්ථවල හා වෙනත් බෞද්ධ ග්‍රන්ථවල සෞන්දර්ය පිළිබඳ දැක්වෙන ගීතය, නැටුම, නාට්‍යය හා චිත්‍රය ආදි බෞද්ධ සංකල්ප පිළිබඳ ව මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනය කරනු ලැබේ. එමෙන් ම බුදුන්වහන්සේ හා බුද්ධ ශ්‍රාවකයන් ස්වභාව සෞන්දර්ය අගය කළ ආකාරය ද මෙහි ලා සාකච්ඡා කරනු ඇත.

බුදුසමයේ ආභාසයෙන් ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික සම්ප්‍රදායේ නිර්මාණය වී ඇති චිත්‍ර, මූර්ති, කැටයම් වැනි කලා ශිල්ප පිළිබඳ අධ්‍යයනයක් කිරීමට තුන් වැනි පරිච්ඡේදය වෙන් කර ඇත. මෙහි දී මෙකී කලාශිල්ප මෙරට බෞද්ධ වෙහෙර විහාර හා සංඝාරාම ආදියෙහි අවට පරිසරය තුළ සුන්දරත්වයක් පවත්වාගෙන යාමටත්, ඒ ගොඩනැගිලි සුන්දරත්වයෙන් අනූන ගොඩනැගිලි බවට පත්කර ගැනීමටත් යොදා ගත් ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීමට විශේෂ අවධානයක් යොමු කර ඇත.

බෞද්ධ සෞන්දර්ය සංකල්ප සහ භාරතීය හා බටහිර සෞන්දර්ය සංකල්ප අතර ඇති සමානකම් හා අසමානකම් පිළිබඳ අධ්‍යයනයක් හතර වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. බුදුදහමේ දැක්වෙන සෞන්දර්යාත්මක අදහස් භාරතීය හා බටහිර කාව්‍ය විචාර ග්‍රන්ථවල දැක්වෙන අදහස් සමඟ යම් බඳු ප්‍රමාණයකට සසඳා බැලීම මේ පරිච්ඡේදයේ අදහසය. බෞද්ධ සෞන්දර්ය කලා සම්ප්‍රදාය අනික් කලා සම්ප්‍රදාය වලින් වෙනස් වන ආකාරය පැහැදිලි කර දැක්වීමටද මෙහිලා අප උත්සාහ කර ඇත.

# උපකාරානුස්මෘති

"බුදුදහම හා සෞන්දර්ය සංකල්ප" නමින් ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කර ගැනීම සඳහා සහයෝගය දැක්වූ බොහෝ දෙනෙකි.

නිබන්ධය සඳහා සුදුසු මාතෘකාවක් තෝරා ගැනීමේ දී මෙන් ම ඌණතා දුරුකරලීමට උපදේශකත්වයෙන් ක්‍රියා කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රා වික්‍රම ගමගේ මහතාට පළමුව මාගේ ගෞරවාන්විත ස්තුතිය පුද කරමි.

මගේ අධ්‍යයනය සම්බන්ධයෙන් මතු වූ ගැටළු නිරාකරණය කර ගැනීමට මෙන් ම, අවශ්‍ය පොතපත සපයා දෙමින් හා නිරන්තරයෙන් මා දිරිමත් කළ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සේ, ආචාර්ය මීගොඩ පඤ්ඤාලෝක ස්වාමීන් වහන්සේ, ආචාර්ය නායිම්බල ධම්මදස්සි ස්වාමීන් වහන්සේ, කථිකාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ, මහාචාර්ය චන්ද්‍රිම විජයබණ්ඩාර මහතා, ආචාර්ය ආරියපාල පෙරේරා මහතා, අධ්‍යනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එච්. එම්. මොරටුවගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඥානදාස පෙරේරා මහතා, ආචාර්ය අභය බණ්ඩාරනායක මහතා සහ සිංහල හා ජනසංනිවේදන අධ්‍යනාංශයේ කථිකාචාර්ය රත්නසිරි අරංගල මහතා ද මෙහි ලා සිහිපත් කරන්නේ ගෞරව පූර්වක බැතියෙනි.

විශේෂයෙන් ම මෙම නිබන්ධය සකස් කිරීමේ දී හැමවිට ම වාගේ මට උපදෙස් ලබා දෙමින් ද, පොතපත සපයා දෙමින් ද, ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කලා සම්බන්ධයෙන් මා සමඟ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා චාරිකාවලට කිහිප අවස්ථාවක ම සහභාගි වෙමින්, එම ස්ථාන පිළිබඳ මා දැනුවත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යනාංශයේ හිටපු අංශ ප්‍රධාන මහාචාර්ය ආනන්ද ගුණසිංහ සූරීන් මෙහිදී මම ගෞරව පෙරදැරිව සිහිපත් කරමි. එසේම මෙම නිබන්ධයේ අත්පිටපත් සකස් කිරීමට බොහෝ සෙයින් උදව් කළ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ බාහිර කථිකාචාර්ය යාපාරත්න වීරසේකර මහතා ද මෙහි ලා මම හදපිරි බැතියෙන් සිහිපත් කරමි.

මෙම අධ්‍යයන කාර්යයේ දී අත්පිටපතේ ව්‍යාකරණ දෝෂ ආදිය සකස් කර දෙමින් මා හට උපකාර කළ ශාස්ත්‍රපති එච්. එල්. එම්. අභයසිංහ මහතා ද සිහිපත් කරන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යනාංශයේ ලිපිකරු ශාස්ත්‍රපති අනුර බමුණුසිංහ මහතා ද, කාර්යාල කාර්ය 'සහායක පුණ්‍යදාස පෙරේරා මහතා ද, මෙම නිබන්ධය පරිගණකයෙන් සැකසූ ඩී. එම්. අයි. කොමිනිකේෂන් ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ නොවක් ස්තුතිය පිරිනැමේ.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | I - VII |
| සංකේත නිරූපණය | VIII |
| ඵලක විස්තර | IX |
| පළමු පරිච්ඡේදය | 1 - 23 |
| සෞන්දර්ය පිළිබඳ නිර්වචනය | |
| 1.1 භාරතීය නිර්වචන | 1 - 6 |
| 1.2 බටහිර නිර්වචන | 6 - 23 |
| දෙවැනි පරිච්ඡේදය | |
| බෞද්ධ ග්‍රන්ථවල සුන්දරත්වය පිළිබඳ දැක්වෙන විග්‍රහ හා විවරණ පිළිබඳ අධ්‍යයනය | 24 - 67 |
| තුන්වැනි පරිච්ඡේදය | |
| බුදු සමයේ ආභාසයෙන් සැකසුණු සෞන්දර්යාත්මක නිර්මාණ කලා | 68 - 85 |
| හතරවැනි පරිච්ඡේදය | |
| බෞද්ධ සෞන්දර්ය සංකල්ප සහ භාරතීය හා බටහිර සෞන්දර්ය සංකල්ප අතර ඇති සමවිෂමතා | 86 - 93 |
| නිගමනය | 94 - 96 |
| පාදක සටහන් | 97 - 106 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 107 - 111 |
| ඵලක | 112 - 123 |

# හැඳින්වීම

මෙම නිබන්ධයේ අභිප්‍රාය වන්නේ බුදු සමය හා සෞන්දර්යය සංකල්ප අතර ඇති සම්බන්ධය පිළිබඳ විචාරපූර්වක අධ්‍යයනයක් කිරීමට ය. බුදු දහම වූ කලී දාර්ශනික පසුබිමක් ඇති බුද්ධිගෝචර ආගමකි. මේ ආගමේ මූලික ඉගැන්වීම් අතර එක් ඉගැන්වීමක් නම් ත්‍රිලක්ෂණ යයි. එයට අනුව ලෝකයේ ඇති සියල්ල අනිත්‍ය ය, දුක්සහිත ය, අනාත්ම ය, ඉපදීම, ජීවිතය, මරණය ආදී සියල්ල දුක් සහිත ය යන්න මේ ත්‍රිලක්ෂණ ඉගැන්වීමෙන් කියැවේ.

සෞන්දර්යය යනු ලෞකික විෂයකි. එහෙයින් මෙහිදී ඉහත කී ආකාරයට ත්‍රිලක්ෂණය පෙරටු කොට ගත් ආගමක් වන බුදු සමය හා ලෞකික විෂයක් වන සෞන්දර්යය සංකල්පය අතර ඇති සම්බන්ධය කුමක් දැයි කෙනෙකුට තර්ක කිරීමට පුලුවන. එපමණක් නොව එබඳු ආගමක් අදහන බෞද්ධයාට සුන්දරත්වයක් දැකිය හැකි ද? කලා රසයක් විඳිය හැකි ද? යනුවෙන් ද ප්‍රශ්න කිරීමට ද පුලුවන. මේ ප්‍රශ්න වලට සතුටුදායක පිළිතුරු අපට සපයා ගත හැක්කේ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් බුදුදහම විග්‍රහ කර බැලීමෙන් ය. බුදුදහම වනාහි සමාජ සංස්ථාවකි. එය කිසිවිටෙකත් සමාජය ප්‍රතික්ෂේප කළ ආගමක් නොවේ. මිනිසා විමුක්ති මාර්ගයට බුදුදහමින් යොමු කෙරෙන්නේ සමාජ සංස්ථාවන්ට අනුකූලවය. ඊට හේතුව නම් මිනිසා සමාජ ගත පුද්ගලයෙකු බව බුදුදහම මැනවින් තේරුම් ගෙන තිබීමයි.

භාරතීය සමාජයේ පහළවූ අනෙකුත් ආගම් හා සසඳා බැලීමේදී බුදුදහමේ පැහැදිලිව පෙනී යන එක් ලක්ෂණයක් නම් අනිත් සියලු ආගමික සම්ප්‍රදායන්ට වඩා බෞද්ධ සම්ප්‍රදාය සමාජය කෙරෙහි මහත් සැලකිල්ලක් දක්වා ඇති බව ය. වෛදික ආගම මුල් අවධියේ දී මුළු මනින්ම රදා පැවතුනේ බ්‍රාහ්මණ අධිකාරයක් මතයි. සාමාන්‍ය ජනතාවගේ සිතුම් පැතුම් කෙරෙහි එම ආගමෙන් සැලකිල්ලක් දැක්වුනේ නැත. සියලු සංස්කාර විධිවලින් ජනතාවගේ ආගමික ජීවිතය බැඳ තබා තිබුන බැවින් සමාජයට ආගමික නිදහසක් වෛදික ආගමෙන් ලැබුනේ නැත. සැබැවින් ම එම ආගම ඒසා විශාල කාලයක් සමාජය තුළ රදා පැවතුනේ පූජක බලයට ඔවුන් යටත්ව සිටි නිසා මිස සමාජමය වශයෙන් ජනතාවගේ සහයෝගයක් එම ආගමට ලැබුන නිසා යැයි කිව නොහැකිය.[1] එහෙත් බුදුදහම සමාජ නිදහස ආවරණය කළ ආගමක් නොවේ. බුදුරදුන් මානව නිදහස මානව චින්තනය අගය කළ බව කාලාම විමංසක ආදී සූත්‍ර තුළින් වටහාගත හැක.[2] වෙනත් ආගම් මෙන් මිනිසා ආගමික බැම්මලින් හිරකර බැඳතබා ගැනීමට කිසිදු උත්සාහයක්ද බුදුන්වහන්සේ නොගත්හ. උන්වහන්සේ ආධ්‍යාත්මික වර්ධනය අගය කලද, සමාජය කිසිවිටෙකත් අමතක කලේ නැත.

මිනිසාගේ ආධ්‍යාත්මික විමුක්තිය පෙරටුකොට ගත් දර්ශනයක් වන බුදුදහම ඇතැම් යුරෝපීය පඬිවරු එක්තරා තාපස දහමක් ලෙසද හඳුන්වති.[3] එබඳු ආගමක් තුළ සමාජය පිළිබඳ හෝ දේශපාලන ආර්ථිකමය අංශ පිළිබඳ කිසියම් චින්තන ක්‍රමයක් සොයා ගැනීම දුෂ්කර බවත් ඒ නිසා ම බුදු සමය ලෝකය ප්‍රතික්ෂේප කරන දේශපාලන හා සමාජ විරෝධී දර්ශනයක් හැටියට ද මැක්ස් වේබර් වැනි සමාජ විද්‍යාඥයෙක් ප්‍රකාශ කරයි. මෙහි ඇත්ත නැත්ත හෙළිදරව් වන්නේ බුදුදහමේ පරම අරමුණ වූ විමුක්තිය පිළිබඳව පමණක් අපගේ සැලකිල්ල යොමුකල හොත් පමණි. බුදුදහම හුදෙක් ගිහි ජීවිතය අත්හැර ගිය අයට පමණක් සීමිත වූ දහමක් නොවේ. ගිහි ජීවිතය සාර්ථක කර ගැනීමට හොඳ සමාජ ක්‍රමයක් ද පුළුල් වශයෙන් එම ආගමේ සාකච්ඡාවට භාජනය වී ඇත.[4] බෞද්ධ දේශපාලන දර්ශනයත්, බෞද්ධ ආර්ථික දර්ශනයත්, බෞද්ධ සමාජ දර්ශනයත් පිළිබඳව බුදුදහමෙහි ඉගැන්වෙන්නේ ඒ පදනම මතය. බුදුදහමේ අඩංගු මෙම සමාජ දර්ශනය අප මෙහිදී තේරුම් ගත යුත්තේ එම ආගම හා කලා රසිකත්වය අතර ඇති සම්බන්ධය සෙවීමට එය පාදක කරගත හැකි හෙයිනි.

බුදුදහම විසින් සමාජය කිසිවිටෙකත් බැහැර නොකරන ලද නිසා බුදු සමයට විශේෂිත වූ කලා සම්ප්‍රදායක් ඒ ඒ සමාජයන්හි බිහි වී ඇති බව පෙනේ. බුදු සමය පැතිර ගිය ලංකාව ඇතුලු අග්නිදිග ආසියාවේ හැම රටකම සමාජය දෙස බලන විට අපට පෙනෙන්නේ බෞද්ධ ශිෂ්ටාචාරය පැතිර ගිය ඒ හැම රටකටම ඒ ඒ රටට අවේණික වූ සංස්කෘතික ලක්ෂණ අනුව හැඩ ගැසුනු කලාත්මක අංශ රාශියක් ඒ ඒ රටවල බිහි වී ඇති බවයි. ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය, කැටයම් කලාව හා සාහිත්‍යය වැනි අංශ ඒවා අතර ප්‍රධාන වෙයි. බුදු සමය ව්‍යාප්තවී ගිය සෑම බෞද්ධ රටකම බෞද්ධ කලාවේ ව්‍යාප්තිය ද මැනවින් දැකිය හැකිය.[5] එක් අතකින් බලන විට කලාව බුදුදහමේ අනිවාර්ය අංගයක් ම නොවේ. එහෙත් එය සමාජයේ අනිවාර්ය අංගයකි. මිනිසාගේ රස වින්දනයට එය අවශ්‍ය වන අංගයක් වේ. බුදුදහම සෞන්දර්ය රසාස්වාදය ප්‍රතික්ෂේප කරන්නක් නම් එය කිසි විටෙකත් බෞද්ධ සංස්කෘතික ඇගයුමක් ඒ පිළිබඳ ව සිදුවිය නොහැකිය. ලංකාව, ඉන්දියාව, චීනය, ටිබෙටය, තායිලන්තය, බුරුමය හා මධ්‍ය ආසියාව ආදී බුදු සමය පැතිර ගිය බොහෝ ප්‍රදේශවල බෞද්ධ කලාව බෞද්ධ සංස්කෘතියත් සමගම අත්වැල් බැඳගෙන හැඩගැසී ගියේ බුදු සමය කිසිවිටෙකත් කලාව ප්‍රතික්ෂේප නොකරන නිසයි. මිනිසාගේ රස වින්දන ශක්තිය ප්‍රබුද්ධ කරන අංග රාශියක් බුදු සමයේ ආභාසයෙන් බෞද්ධ රටවල නිර්මාණය වී තිබේ. ඒවා අතුරින් එක් අංගයක් නම් මූර්ති ශිල්පයයි.

මූර්ති කලාව හෙවත් පිළිම නෙලීම මෙරට ආරම්භ වූයේ භාරතයේ බුදුපිළිම නෙලීම ආරම්භ වූවාට පසුව යැයි සැලකේ. ලංකාවේ පිළිමවල ඉන්දීය ආභාෂය මැනවින් දක්නයට ලැබේ. ඒ නිසා ඒවා අමරාවතී, මථුරා, ගන්ධාර ආදී ඉන්දීය කලා සම්ප්‍රදායන්ට නෑකම් දක්වන බව කිවහැකිය.[6] එහෙත් ලංකාවේ බුදුපිළිම දේශීය මුහුණුවරක් අනුව නිර්මාණය වූ සංස්කෘතික අංග හැටියට සැලකිය හැකිය. ශ්‍රී ලාංකික මූර්ති කලාව ලෝකයේ විශිෂ්ටතම කලා කෘති සමග එක්ව තැබිය හැකි ආකාරයෙන් දියුණු වී ඇති කලා මාධ්‍යයකි. මහමෙවුනාවේ සමාධි බුදුපිළිමය සහ තොළුවිල බුදුපිළිමය ලොව ඇති විශිෂ්ටතම බුදුපිළිම ලෙස සලකනු ලැබේ.[7] සිංහල බෞද්ධ කලාකරුවා මෙයට අවුරුදු දහස් ගණනකට පෙර බුදුන්වහන්සේගේ ස්වරූපය මේ ආකාරයෙන්ම මූර්තිමත් කර තිබීමෙන් පෙනෙන්නේ ඔහුගේ කලා කෞශල්‍යය කෙරෙහි බෙහෙවින් ම බෞද්ධ ආභාෂය ලැබී තිබුණ බවය.

කැටයම් කලාව හැටියට සලකනු ලබන්නේ සඳකඩ පහන, මුරගල්, කොරවක් ගල්, පියගැට පෙළ, නාගරූප, බහිරව රූප ආදියයි. මේ කලාත්මක අංග අතරින් සඳකඩ පහන පමණක් ගෙන වුවද බලන විට එය උසස් ගනයේ කලා නිර්මාණයක් ලෙස ගිනිය හැකිය.[8] සඳකඩ පහන ලංකාවේ කැටයම් කලාවේ විශිෂ්ට තම කලා කෘතියක් ලෙස සලකනු ලබන්නේ එහි ඇති කලාත්මක වූද සෞන්දර්යාත්මක වූද හරය නිසාය.

චිත්‍ර කලාව ඉපැරණි යුගයක සිට ලංකාවේ පැවත එන්නකි. එහෙත් වැඳගත් කලාවක් වශයෙන් එය වර්ධනය වූයේ බුදු සමයේ ආභාෂය නිසාය. ශිලා යුගයට අයත් සිතුවම් කලාද ශ්‍රී ලංකාවේ තිබේ. ඒවා තන්තිරිමලේ ගල්ලෙනක සහ පිහිල්ලගොඩ ගල්ලෙනක දක්නට ඇත. ගුරුගල් වලින් ඇඳ ඇති මෙම සිතුවම් රේඛා සිතුවම් ලෙස සලකනු ලැබේ. ලංකාවේ සිතුවම් කලාවේ විශිෂ්ඨත්වය පිළිබිඹු වන්නේ සීගිරි සිතුවම් වලය. චිත්‍ර කලාව දියුණු වූයේ අනුරාධපුර යුගයේ මුල්කාලයේ සිටය. එය නුවර යුගය වන විට දේශීය සංස්කෘතියේ ආභාසය ලබමින් වර්ධනය වී ගියේය. මහියංගන සෑයෙහි ධාතු ගර්භයෙහිද චිත්‍ර සිතුවම් කර තිබේ. ඒ චිත්‍රවලින් පෙනෙන්නේ ඒ කලාවේ උසස් දියුණුවක් එකල පැවති බවයි. සීගිරියේ චිත්‍ර ඉන්දීයාවේ අජන්තා ඇල්ලෝරා චිත්‍රවලටත් වඩා ඉහළින් සිටින චිත්‍ර බව මහාචාර්ය පරණවිතාන පවසයි.[9] මෙබඳු කලාත්මක නිර්මාණ බිහිකිරීම සඳහා සිංහල කලාකරුවා දීර්ඝ කාලයක් තිස්සේ මේ සඳහා මහත් වෙහෙසක් දරන්නට ඇත. ඔහුට ඒ පිළිබඳ මනා පළපුරුද්දක් ද තිබෙන්නට ඇත. පසු කලකදී ලද ද්‍රවිඩ ආභාෂය සහ හින්දු ආභාෂය නිසා සිංහල බෞද්ධ කලාවේ සංස්කෘතික ඌරුව යම්බදු ප්‍රමාණයකට අඩු වී ගිය බව පෙනෙන නමුත් ඒ විශිෂ්ට කලාත්මක නිර්මාණයන් හි උදාරත්වය සහ දේශීයත්වය නම් හීන වී ගිය බවක් නම් නොපෙනේ.

ශ්‍රී ලංකාවේ චිත්‍ර, මූර්ති, කැටයම් වැනි කලා ශිල්ප වැඩි දියුණු වීම කෙරෙහි බෙහෙවින් බලපෑවේ ථේරවාදී බුද්ධදහමයි. මේ කලා සම්ප්‍රදායන් දියුණු කිරීම සඳහා ඉන්දියාවෙන් මෙරටට ගෙන්වා ගන්නා ලද ශිල්පීන් ඇතැම් විට ථේරවාද බුද්ධදහමේ අදහස් අනුව මෙකී කලා ශිල්ප දියුණු කලා විය හැකිය. ථේරවාද බුද්ධදහම මිනිසුන්ගේ විනෝදය සඳහා වූ නෘත්‍ය, ගීත, වාදිත වැනි කලාවන් දියුණු කිරීම සඳහා එතරම් අනුබලයක් දුන් ආගමක් නොවේ. ආධ්‍යාත්මික හැඟීම් මතු කරනු වස් නිර්මාණය වූ කැටයම් කලාව, මූර්ති කලාව, චිත්‍ර කලාව, වැනි කලාවන් කෙරෙහි ථේරවාද බුද්ධදහමේ ආභාෂය ලැබුනේ ඒ අනුවය. නැටුම්, ගැයුම්, වැයුම්, ආදියෙන් තොරව ධ්‍යාන භාවනානුයෝගී ජීවිතයක් ගත කළ යෝගාවචර භික්ෂූන් වහන්සේගේ ජීවිතයට එබඳු චක්ෂු ගෝචර කලාවන් උචිතය යනු ථේරවාද බෞද්ධයන්ගේ පිළිගැනීම විය.[10] අනුරාධපුර යුගයේ මුල්භාගයේ සිටි විදග්ධ පඬිවරුන්ට සංගීතය, නැටුම්, නාට්‍ය වැනි කලාවන් පිළිබඳව දැනුමක් නොතිබුනා යැයි සිතිය නොහැකිය. එබඳු කලාවන් ඇතැම් පුද්ගලයන් විනෝදය සඳහා පරිශීලනය කළ බව කව්සිළුමිණේ එන මධුපානෝත්සවය පිළිබඳ වර්ණනාවෙන් හෙළිවේ.[11] උතුරු ඉන්දියානු රජවරුන්ගේ සිතුම් පැතුම් අනුගමනය කළ මෙරට සිංහල රජවරුන් රාජ්‍ය අභිෂේකය වැනි උත්සව වලදී නැටුම, සංගීතය හා නාට්‍ය වැනි කලාත්මක අංශ කෙරෙහි ඇල්මක් නොදැක්වූවා යැයි කිව නොහැකිය. සාමාන්‍ය ජනයා අතර කෙසේ වෙතත් රජවරුන් අතර විනෝද කලා ශිල්ප තිබුන බවට බොහෝ සාධක තිබේ. නාට්‍යයන්, නර්තනයත්, සංගීතයත් ගර්හිත විද්‍යා වශයෙන් කතිකාවත් වල සඳහන් කොට ඇත.[12] එසේ සඳහන් වන්නේ පොදු ජනයා හා භික්ෂූන් අතර එබඳු කලාත්මක අංශ දියුණුව තිබුන හෙයිනි. මේ බව 13 වැනි සියවසේ කතිකාවත් පැන වූ පැරකුම් රජු දුටු බවට සැක නැත. මේ රජු කලා ශිල්ප ගැන උනන්දු වූ කෙනෙකි. භික්ෂූන් විනෝද කලා අත්හැරිය යුතු යැයි ඔහු කතිකාවන්වල සඳහන් කළේ ඒ නිසා විය හැකිය. නච්ච ගීත වාදිත විශුක දස්සන ආදිය භික්ෂූන් පමණක් නොව ගිහියන් විසින්ද අත්හැරිය යුතු බව සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වේ.[13]

බුදු සමයෙන් සැකසුනු සංස්කෘතිය ඉතා දැහැමි වූවකි. ඒ නිසා විවේක අවස්ථාවල පින්දහම් කිරීමේ ලැදියාව එම සංස්කෘතිය තුළ පිවත් වූ සිංහලයන් තුළ වර්ධනය වූවා මිස නච්ච ගීත වාදිත වැනි කලාවන් දියුණු කිරීමට එතරම් සැලකිල්ලක් නොවීය. ඒ නිසා සිංහල සංස්කෘතියෙහි වර්ධනය වී ගියේ මිනිසාට ඇසින් දැක බලා ගනිමින් කුසල් සිත් පහදවා ගනිමින් විනෝදාස්වාදයක් ද ලබා ගත හැකි කලා ශිල්පයන් ය. ධාර්මික විනෝදාස්වාදය සමග කුසල් රැස්කර ගැනීම සඳහා නැටුම් ගැයුම් වැයුම් වුවද පැවැත්විය හැකිය. පෙරහැර, බුද්ධ පූජා, පිරිත් පින්කම් ආදී ආගමික උත්සව වලදී නැටුම් ගැයුම් වැයුම් පැවැත් වෙන්නේ ඒ පදනම අනුවය. ඒ අනුව බෞද්ධයා කලාව උපයෝගී කොට ගෙන ඇත්තේ තෙරුවන් පිදීමටත් තමන් තුළ ආධ්‍යාත්මික වින්දනයක් හා පාරිශුද්ධියක් ඇති කර ගැනීමට ය. මේ අනුව අතීතයේ පටන්ම සිංහල බෞද්ධ කලා කාරයෝ විවිධ බෞද්ධ අදහස් කලාව සමග මුසු කරමින් පොදු ජනතාව වෙත ඉදිරිපත් කළහ. චිත්‍ර ශිල්පීහු බුදුන්වහන්සේගේ චරිත කතා සහ

ජාතක කතා චිත්‍රයට නැගූහ. කැටයම් ශිල්පීහු නොයෙකුත් බෞද්ධ අදහස් කැටයමට නැගූහ. සඳකඩ පහන හා මුරගල වැනි සංකේතමය කලා කෘති බිහිවූයේ ඒ පදනම අනුවයි. මූර්ති ශිල්පීහු සිත්පිත් නැති කළුගල් වලට පනදී බුදුන්වහන්සේගේ අසිරිමත් රූපශ්‍රීය ලොවට මවා පෙන්වූහ. ගෘහනිර්මාණ ශිල්පීහු දාගැබ් ඉදිකළහ. මෙයින් පැහැදිලි වන්නේ සිංහල බෞද්ධ කලා ශිල්පියා බුදුදහමේ ආභාෂය ලබමින් බෞද්ධයාට සුන්දරත්වයක් දැකිය හැකි, කලා රසයක් විඳිය හැකි කලාත්මක අංශ රාශියක් නිර්මාණය කිරීමට උත්සහ කර ඇති ආකාරයයි.

බුදු සමය හා කලා ශිල්ප අතර සම්බන්ධයක් නැතැයි ඇතැම් විද්වතුන් තර්ක කරන නමුත්, මහාචාර්ය සරත්චන්ද්‍රයන්ගේ සිංහල ගැමි නාටකයේදී පහත සඳහන් අගනා විග්‍රහයෙන් මේ දෙක අතර ඇති සම්බන්ධතාව මැනවින් ප්‍රකට වේ.

> බුදු සමය විසින් කලාශිල්පවලට අනුබලයක් නොදෙන ලදැයි ඉඳුරාම පැවසිය නොහැක්කක් බව අජන්තා, එල්ලෝරා හා බාග් යන තන්හි සිතුවම් කොට ඇති ගුහා චිත්‍රයන්ගෙන් ද ගුප්ත යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවේත් ජපානයේ නෝ නාට්‍යයේත් අනුරාධපුර බුද්ධ රූපයේත් කලාත්මක අගය සැලකීමෙන් ද පෙනී යයි. තවද අග්නිදිග ආසියාවේ සංස්කෘතියේ මූලාශ්‍රය වූයේ බුදු සමය බව ද අප විසින් අමතක නොකළ යුත්තකි. එහෙත් මෙහිදී බුදු සමය යන පොදු නමින් අප හඳුන්වන්නේ බුදු සමයේ ශාඛා දෙකක්, එනම් බුද්ධ දේශනාවේ නිර්මලත්වය හා මුල් ස්වරූපය දැඩි කොට රකින ස්ථවිරවාද බුද්ධාගමත්, මුල් අනුශාසනා අතින් මඳක් ලිහිල්ව ගිය ද පෘථුල මාර්ගයක් වශයෙන් සකස් වී හැඩ ගැසුණු මහායාන බුද්ධාගමත් බව සිතෙහි තබා ගැනීම වටී. රටින් රට පැතිර යත් ම මහායාන බුද්ධාගම හැඩගැසුණේ ඒ ඒ දේශවල ජනතාවගේ ඇදහිලි උකහාගනිමින් හා මිනිසුන්ගේ නානාවිධ චාරිත්‍ර වාරිත්‍රවලට ඉඩ දෙමිනුන්ය. එහෙත් ස්විරවාද බෞද්ධයෝ නම් අබෞද්ධ ඇදහිලි ආදිය අනුමත කිරීමෙන් හෝ ආගම තුළට වැද්ද ගැනීමෙන් තමන්ගේ ධර්මදූත කාර්යයට පිහිටක් විය හැකි බැව් නොතකාම බුද්ධ ධර්මයේ නිර්මලත්වය රැක ගන්නට වෑයම් කළහ. පුද්ගල විමුක්තිය පරමාර්ථ කොට ගත් ස්විරවාද බුද්ධාගම විසින් උසස් කොට සලකන ලද්දේ සාමූහික පූජාකර්ම හෝ සමාජ ජීවිතයට සහභාගී වීම ආදිය නොව ධ්‍යාන මාර්ගයට අනුකූල වූ හුදකලා ජීවිතයත් විදර්ශනා වැඩීමත් යනාදිය යි. මෙවැනි ධ්‍යාන මාර්ගයකට බාධා නොපමුණුවන කලා ශිල්පවලට එනම් සාමූහික ව නොකෙරෙන කලා ශිල්ප කෙරෙහි ස්ථවිරවාද බුද්ධාගම විසින් වුව ද අප්‍රසාදයක් පළ කරන බවක් නොපෙනේ. චිත්‍ර කලාවත් ප්‍රතිමා කලාවත් ගෘහ නිර්මාණ ශිල්පයත් ස්ථවිරවාද බුද්ධාගම යටතේ වර්ධනය වූ බව ද බුදුපිළිමය මාහැඟි කලා නිර්මාණයක් වශයෙන් ගැනුණේ එම

ක්ෂේත්‍රයෙන් බව ද ප්‍රකට කරුණුය. වෙන අතකින් ආත්ම ප්‍රකාශනයට ඉඩ නොලැබූ ස්ථවිරවාද බෞද්ධයන් තුළ වූ කලා ශක්‍යතාව පැරණි ගොඩනැගිලි, උයන්, පොකුණු යන මේවායේ දක්නට ලැබෙන නානාවිධ ගල් කැටයම් හා විසිතුරු ගෘහාලංකාරණාදියෙහි මූර්තිමත් වී ඇත්තා සේ ය. අලංකරණ ශිල්පය, ප්‍රතිමා ශිල්පය හා චිත්‍ර ශිල්පය යන මේ ක්ෂේත්‍රයන්හි මානුෂික කෞශල්‍යයෙන් නිපදවිය හැකි තාක් සෞන්දර්යයෙන් භික්ෂුවගේ හුදකලා ජීවිතය පෝෂණය කරන ලද බව පෙනේ. සංගීතයෙනුත්, නාට්‍ය කලාවෙනුත්, විඳීමට තහනම් කරන ලද රස්සාවාදයක් චක්ෂුගෝචර කලා ශිල්පවලින් ලැබීමට ඔහුට ඉඩ තිබිණි. ඉන්ද්‍රිය සංවරයට හානියක් නොවන පිරිදි ප්‍රතිමාවක සෞන්දර්යය හෝ චිත්‍රයක වර්ණය හෝ ගල් කැටයමක විචිත්‍රභාවය හෝ නරඹා රස විඳීමට ඔහුට හැකි විය.[14]

සංගීතය, නැටුම හා නාට්‍ය යන කලාවන්ට බුදු සමය විසින් එතරම් අනුබලයක් දක්වා නැත්තේ කවර නිසා දැයි ඉහත සඳහන් කරන ලද විග්‍රහයෙන් පැහැදිලි වේ. මිනිසුන්ට ඇසින් දැකිය හැකි, දැක කාම තෘෂ්ණාව තුනීකරගත හැකි, පහන් සංවේගය ඇති කරගත හැකි කලා ශිල්ප වලට බුදුදහමින් කිසිදු බාධාවක් ලැබුනේ නැත. නිකෙලෙස් ජීවිත පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම එම ආගමේ අරමුණයි. එහෙයින් නැටුම්, ගැයුම්, වැයුම්, වැනි කලාවන් සමාජ ජීවිතයට ඇතුළත්ව තිබුන නමුත් ඒවා උසස් ගනයේ කලාත්මක අංග ලෙස සැලකූ බවක් නොපෙනේ. බෞද්ධ කලාවේ අරමුණ භාව සංයමයයි. භාව ප්‍රකෝපණයට එහි ඉඩක් නැත. බුදු සමයේ ආභාෂයෙන් දැකසුනු හැම කලාත්මක අංගයකම ලක්ෂණය වූයේ එයයි.

**විෂය ක්ෂේත්‍රය :**

බුදුදහම හා සෞන්දර්ය සංකල්ප අතර ඇති සම්බන්ධය පිළිබඳව බෞද්ධ සහ සමාජ සංස්කෘතික දෘෂ්ඨි කෝණයෙන් විග්‍රහ කර බැලීම; භාරතීය පොත්පත්වල සහ බටහිර කාව්‍ය විචාර ග්‍රන්ථවල දක්වෙන විවිධ නිර්වචන පිළිබඳව තුළනාත්මකව සාකච්ජා කිරීම; ත්‍රිපිටක සාහිත්‍යයෙහි හා වෙනත් බෞද්ධ ග්‍රන්ථවල සෞන්දර්ය පිළිබඳ ව ඉදිරිපත්ව ඇති අදහස් පරීක්ෂා කිරීම; බුදුන්වහන්සේ හා බුද්ධ ශ්‍රාවකයින් ස්වභාව සෞන්දර්ය දුටු ආකාරය; උදාන ස්වරූපී ගාථා ඇසුරින් පරීයෂා කිරීම; බුදු සමයේ ආභාෂයෙන් බිහිවී ඇති නිර්මාණාත්මක සෞන්දර්ය කලාවන් සහ ඒවාහි අන්තර්ගත සංකේතාර්ථ පැහැදිලි කිරීම; බෞද්ධ සෞන්දර්ය සංකල්පනා සහ භාරතීය සහ බටහිර සෞන්දර්ය අතර ඇති සම විෂම හා පරීක්ෂා කිරීම මෙම නිබන්ධයේ විෂය ක්ෂේත්‍රවේ.

## විෂය සීමාව :

බුදු සමය සහ සෞන්දර්ය සංකල්පය අතර ඇති සම්බන්ධය පිළිබඳ ව මෙතෙක් ප්‍රකාශයට පත්ව ඇති ලිඛිත සාහිත්‍යයත්, ඒ පිළිබඳ ජනශ්‍රැතියත්, එහා සම්බන්ධ බෞද්ධ කාව්‍ය ඇඳහිලි හා උත්සව ආදියත්, පෙළපොත්වල හා වෙනත් බෞද්ධ කාව්‍ය ග්‍රන්ථ වැනි ලිඛිත මූලාශ්‍රය හා බෞද්ධ සෞන්දර්ය සංකල්පනා පිළිබඳ ව වාචික සම්ප්‍රදායේ එන ප්‍රකාශනත්, නිර්මාණාත්මක සෞන්දර්ය පිළිබඳ අධ්‍යයනයත් මෙම අධ්‍යයනයේ විෂය සීමාව වේ.

## පර්යේෂණ විධික්‍රමය :

මෙම පර්යේෂණය සඳහා අප විසින් අනුගමනය කරන ලද පර්යේෂණ විධික්‍රම දෙකක් වේ. එයින් පළමු වෙනි ක්‍රමය නම් ඓතිහාසික දෘෂ්ටි කෝණයෙන් බුදු සමය හා සෞන්දර්ය සංකල්පය අතර ඇති සම්බන්ධය පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමයි. දෙවැනි ක්‍රමය නම් සමාජ හා සංස්කෘතික දෘෂ්ටිකෝණයෙන් සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය තුළින් කරුණු පරීක්ෂා කිරීමය.

## ඓතිහාසික විශ්ලේෂණය :

මෙහි ඓතිහාසික විශ්ලේෂණ ක්‍රමය ලෙස සැලකෙන්නේ මෙම විෂය ක්ෂේත්‍රයට ඉඳුරාම අදාල වූ ද, වක්‍රව සම්බන්ධ වූ ද, ඓතිහාසික ලිපි ලේඛණ ආදිය ඒකරාශි කොට ගෙන විමර්ශණය කිරීම සඳහා අප ගත් මාර්ගය වෙයි. බුදු සමය සහ සෞන්දර්ය සංකල්ප පිළිබඳව විද්වතුන් විසින් ලියන ලද ලිපි ලේඛණ රාශියක් ඇති අතර එම මූලාශ්‍රයන් අපේ මෙම නිබන්ධය ඓතිහාසික විමර්ශනයකට තුඩුදෙන අර්ථ දර්ශනයක් අනුව ඉදිරිපත් කිරීමට බෙහෙවින් උපකාරී විය.

## ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය :

ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය යටතේ අප විසින් කරන ලද්දේ විෂයානු බද්ධ කරුණු පිළිබඳ අවබෝධයක් ඇතැයි අපට පෙනී ගිය සුවිශේෂ පුද්ගලයන් මුණගැසී සම්මුඛ සාකච්ඡා පවත්වා කරුණු එක්රැස්කර ගැනීමය. එම සාකච්ඡා සඳහා ක්‍රම දෙකක් අනුගමනය කළෙමි. එනම් ආකෘතිකමය ක්‍රමය සහ අනාකෘතිකමය ක්‍රමය[15] යන ක්‍රම දෙකයි. මීට අමතර වශයෙන් අනුරාධපුර සහ පොළොන්නරු යන පැරණි රාජධානිවල ඇති නිර්මාණාත්මක කලා පිළිබඳව කාලයක් තිස්සේ අප විසින් නැරඹීමෙන් ලබන ලද අත්දැකීම් සහ වසරක් පාසා බිහිවැඩ චාරිකා මගින් සිසුන් සමග සහභාගි වෙමින් කරන ලද පර්යේෂණ ආදිය ද ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමයේදී අපට ඉවහල් විය. මෙම නිබන්ධයට කරුණු රැස් කිරීමේදී පූර්වෝක්ත පර්යේෂණ විධික්‍රම අප විසින් අනුගමනය කරන ලද අතර ඒ ක්‍රම තුළින් කරුණු ඒකරාශි කොට ගෙන ඒවා වර්ගී කරණය කොට, ඒවාහි ඇති ගුණාත්මක වටිනාකම් පිළිබඳව ඇගයීම් සැලකිල්ලට ගෙන මෙම නිබන්ධය සම්පාදනය කළෙමු.

## සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අනි. | - | අංගුත්තරනිකාය |
| අපදාන. | - | අපදාන පාළි |
| ඛුනි. | - | ඛුද්දකනිකාය |
| චූව. | - | චූල්ලවග්ගපාලි |
| ථෙර. | - | ථෙරගාථාපාලි |
| දීනි. | - | දීඝනිකාය |
| ධඅගැ. | - | ධම්පියා අටුවා ගැටපදය |
| ධප්‍ර. | - | ධර්මපද ප්‍රදීපය |
| පරමත්ථ. | - | පරමත්ථජෝතිකාව |
| මනි. | - | මජ්ඣිමනිකාය |
| මනෝරථ. | - | මනෝරථපූරණී |
| මව. | - | මහාවග්ගපාලි |
| මවං. | - | මහාවංසය |
| විමාන. | - | විමානවත්ථුපාලි - පෙටවත්ථුපාලි |
| විශුද්ධි. | - | විශුද්ධිමාර්ගය |
| සද්ධර්ම. | - | සද්ධර්මරත්නාවලිය |
| සනි. | - | සංයුක්ත නිකාය |
| සපා. | - | සමන්තපාසාදිකාව |
| සාදී. | - | සාරත්ථදීපනී |
| සුනි. | - | සුත්තනිපාත |

# ඵලක විස්තර

1. ථූපාරාම දාගැබ
2. මිහින්තලේ කණ්ඨක චෛත්‍ය වාහල්කඩ
3. මැදිරිගිරිය වටදාගෙය
4. පොළොන්නරුව තිවංක පිළිමගෙයි දේවාරාධනය
5. අනුරාධපුර බිසෝමාළිගයෙහි සඳකඩ පහණ
6. අනුරාධපුර රත්නප්‍රාසාදයෙහි මුරගල
7. අනුරාධපුර අභයගිරි ස්ථූපයේ වැලිමළුවට පිවිසෙන දකුණු ගෝපුරය ඉදිරිපස දෙපැත්තේ සංඛ හා පත්ම මුරගල්
8. අනුරාධපුර රත්නප්‍රාසාදයේ කොරවක්ගල
9. අනුරාධපුරයෙහි කුට්ටම් පොකුණ
10. පොළොන්නරුවෙහි තිවංක පිළිමගෙය අසල ඇති නෙළුම් පොකුණ
11. අනුරාධපුරයෙහි සමාධි පිළිමය
12. තොලුවිල පිළිමය
13. අවුකන පිළිමය
14. පන්කුලිය පිළිමය
15. පොළොන්නරුව ගල්විහාරයෙහි විජ්ජාධර ගුහාවෙහි පිළිමය

# පළමු වැනි පරිච්ඡේදය

## සෞන්දර්ය පිළිබඳ නිර්වචන

### 1.1 භාරතීය නිර්වචන

සෞන්දර්ය සංකල්පය හා එහි ඉතිහාසය පිළිබඳ ව භාරතීය සෞන්දර්යවාදීන් හැටියට සැලකෙන භරතමුනි, ආනන්ද වර්ධන, මම්මට, වාමන, දණ්ඩී ආදීන් විසින් ඔවුන්ගේ කාව්‍යවිචාර ග්‍රන්ථවල විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇති අතර, බටහිර කාව්‍යවිචාරවාදීන් හැටියට සැලකෙන ප්ලේටෝ, ඇරිස්ටෝටල්, කාන්ට්, ලියෝ තෝල්ස්තෝයි ආදීන් විසින් ඔවුන්ගේ කාව්‍යවිචාර ග්‍රන්ථවල ද, විවිධ මතිමතාන්තර හා ප්‍රකාශන මාර්ග ද, විවිධ සිද්ධාන්ත ද ඉදිරිපත් කර ඇත. මෙම පරිච්ඡේදයේ අපේක්ෂාව වන්නේ සුන්දරත්වය පිළිබඳ ව භාරතීය හා බටහිර කාව්‍ය විචාරවාදීන් විසින් ඉදිරිපත් කරන ලද සිද්ධාන්ත පිළිබඳ අධ්‍යයනයක් කිරීම ය. මෙහි ලා පළමුවෙන් ම භාරතීය සෞන්දර්යවාදය හා බටහිර සෞන්දර්යවාදය අතර, ප්‍රායෝගික වශයෙන් දක්නට ලැබෙන සමානකම් හා අසමානකම්, සැලකිල්ලට ගනිමින් භාරතීය කවීන් සෞන්දර්ය සම්බන්ධයෙන් දක්වා ඇති අදහස් පිළිබඳ විමසා බැලීමක් කරනු ලැබේ.

ප්‍රායෝගික වශයෙන් බලන විට, භාරතීය කවීන් අතර දියුණු වී ගිය සෞන්දර්ය විද්‍යාවට වඩා බටහිර කවීන් අතර දියුණු වී ගිය සෞන්දර්ය විද්‍යාව තුළ වෙනසක් ඇති බව පෙනේ. ඒ වෙනස නම් භාරතීයයන් සෞන්දර්ය විද්‍යාව වැඩි වශයෙන් ම ප්‍රායෝගික වටිනාකමක් ඇති විෂයයක් වශයෙන් දියුණු කිරීමට උත්සහ ක්‍ර තිබීමත්, අපරදිග කවීන් වැඩි වශයෙන් එය දාර්ශනික මට්ටමින් දියුණු කිරීමට උත්සහ කොට තිබීමත් ය. භාරතීය සෞන්දර්ය විද්‍යාව සියුම් ලෙස පරීක්ෂා කර බලන විට, එය මූලික වශයෙන් අංශ 03 ක් ඔස්සේ විකාශනය වී ඇති බව එහි ඉතිහාසය තුළින් පෙනේ. උදාහරණයක් වශයෙන් ඔවුන්ගේ කාව්‍යය සැලකිල්ලට ගතහොත් එහි දී කාව්‍යය යනු කුමක් ද? කාව්‍යයක් විචාරයට ලක් කරනු ලබන්නේ කෙසේද? කාව්‍යයක රස විඳින්නේ කෙබඳු කෙනෙක්ද ? යන මූලික කරුණු තුන කෙරෙහි ඔවුන් අවධානය යොමු කොට ඇත. එමෙන්ම චිත්‍ර, මූර්ති කැටයම් ආදී සෞන්දර්ය නිර්මාණ හා බැඳුණු සංකල්ප සම්බන්ධයෙන් බැලුව ද, භාරතීය කවීන් සහ කලාකරුවන් සාකච්ඡා කරන්නේ එබඳු ම පදනමක් මත සිට ය. මෙයින් පෙනි යන්නේ බටහිර කවීන් මෙන් භාරතීය කවීන් දාර්ශනික පැත්තට වඩා ප්‍රායෝගික අංශයට ඔවුන්ගේ සෞන්දර්ය විද්‍යාව යොමු කිරීමට උත්සහ කර ඇති බව ය.

පෙරදිග භාෂා ශාස්ත්‍ර පිළිබඳ විශේෂඥයෙකු වූ මැක්ස්මුලර් ප්‍රකාශ කරන පරිදි, බටහිර කවීන් දාර්ශනිකයන් හැටියට සලකනු ලැබුව ද, ඔවුන්ට සුන්දරත්වය වටහා ගැනීමට අපහසු විය. ඒ කෙසේ වුවද, බටහිර දාර්ශනිකයින් සෞන්දර්යය සම්බන්ධයෙන් වැඩි වශයෙන් ග්‍රන්ථ නොලියුව ද, ඔවුන්ට සෞන්දර්යය පිළිබඳ අවබෝධයක් නොතිබුණේ යැයි කිම සාධාරණ නැත. ආචාර ධර්ම භාරතීය දර්ශනයේ එක් අනිවාර්ය අංගයක් බවට පත්වූ අතර අනෙක් අතින් ජීවිතයේ පැවැත්ම සඳහා සුන්දරත්වය උපයෝගි කර ගැනීම ද, එහි තවත් අංගයක් බවට පත් විය. මේ හේතුව නිසා භාරතීයන්ගේ සෞන්දර්ය විද්‍යාව සහ ඔවුන්ගේ ආචාර විද්‍යාවත් බටහිර සෞන්දර්ය විද්‍යා අතරත් ඉතා සමීප සම්බන්ධයක් ගොඩනැගුණු බව ද දක්නට ලැබේ.

එක් අතකින් සත්‍යය නියත වශයෙන්ම මනෝඥ ස්වභාවයක් (සත්‍යම් ශිවම් සුන්දරම්) ඇති දෙයක් හැටියට සැලකූ භාරතීයයන් විසින් අනෙක් අතින් එම සත්‍යය සුන්දරත්වයක් ඇති දෙයක් හැටියට සලකා තිබේ. මේ අනුව සලකන විට, මනෝඥත්වය සහ සුන්දරත්වය යන සංකල්ප දෙක අතර අපූර්ව සම්බන්ධයක් ඇති බව භාරතීයන් විසින් වටහා ගන්නා ලද බව ද පෙනේ. මේ කාරණය මැනවින් පැහැදිලි වන්නේ සංස්කෘත සාහිත්‍යයේ කාව්‍යාලංකාර පිළිබඳව සලකා බලන විට ය. සංස්කෘත කවීන් විසින් ඉදිරිපත් කරන ලද කාව්‍යාලංකාරයේ මූලික අභිප්‍රාය වූයේ කාව්‍යයේ සහ අලංකාරයේ මූලධර්ම පිළිබඳ විග්‍රහ කර දැක්වීම ය. ඒ මූලධර්ම ඇසුරු කරගෙන සෞන්දර්ය පිළිබඳ සිද්ධාන්තද සංස්කෘත කවීන් අතර ගොඩනැගී තිබේ. මේ කාරණය තේරුම් ගැනීමේදී භාරතීය දර්ශන ඉතිහාසය සැලකිල්ලට ගැනීම අවශ්‍ය ය. භාරතීය දර්ශනය තුළ සෞන්දර්යවාදය පිළිබඳ කිසියම් ප්‍රවණතාවයක් ද දක්නට ලැබේ.

කෙසේ වුව ද කාව්‍ය විචාරය සම්බන්ධයෙන් වියතුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් පැහැදිලි ලෙස අවබෝධ කර ගැනීම එතරම් පහසු නොවේ. බොහෝ අය උත්සාහ කොට ඇත්තේ භාරතීය භාමහ, දණ්ඩි, රුද්‍රට, වාමන ආදී සෞන්දර්යවාදීන් කාව්‍යය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී දක්වා ඇති කාව්‍යය වස්තුවේ ශරීරය සහ ආත්මය යන කොටස් දෙක පිළිබඳ ව පරීක්ෂා කර බැලීමට ය. මෙහි දී කාව්‍යයේ ශරීරය ලෙස සලකන ලද්දේ වචනයයි.[1] ආත්මය වශයෙන් සලකන ලද්දේ සෞන්දර්ය වස්තුවයි. ආත්මය සෙවීම ගැන විවිධ අදහස් ඉදිරිපත්වී ඇති අතර ඇතැම් අය කාව්‍යයේ ආත්මය වශයෙන් සලකන ලද්දේ අලංකාරයයි.[2] මේ අතර සමහරු ධ්වනිය සෞන්දර්යයේ ආත්මය ලෙස සැලකූහ.[3] 'කාව්‍යං රසාත්මකං වාක්‍යං'[4] යන කියමනට අනුව රසවත් වැකිය කාව්‍යය ලෙස සමහරු සැලකූහ. ඇතමුන් විසින් රීතිය, ආත්මය[5] ලෙස සලකන ලද අතර ඇතැම්හු කාව්‍යයේ ගුණය ආත්මය[6] ලෙස සැලකූහ. දණ්ඩින්ගේ *කාව්‍යාදර්ශය* වැනි අලංකාරවාදී ග්‍රන්ථයන්හි ගුණදෝෂ අලංකාර පිළිබඳව විවිධත්වයකින් ඉදිරිපත් කර ඇති අදහස් දක්නට ලැබේ. එබඳු වෙනස්කම් එකී ග්‍රන්ථයන්හි දක්නට ලැබුණ ද සෞන්දර්ය සම්බන්ධයෙන් ද, ඒවා තුළ වැදගත් අදහස් අන්තර්ගත ව තිබේ.